**සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩල අරමුදල - 2021**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩල අරමුදලේ 2021 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම, සමුච්චිත අරමුදල වෙනස්වීමේ ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 දෙසැම්බර් 31 දිනට ඉතිරි කොඩි,ස්ටිකර් හා මුද්‍රිත රෙදි කොඩි වටිනාකම පිළිවෙළින් රු.326,250 ක්, රු.34,750 ක් හා රු.741,300 ක් වූ අතර එම වටිනාකම් ජංගම වත්කම් වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. එමෙන්ම, වර්ෂය අවසාන තොග ගණනයක් සිදු කර නොතිබුණු අතර එම කොඩි හා ස්ටිකර් ක්‍රමවත්ව ගබඩා කර නොතිබීම හේතුවෙන්, භෞතික තොගය විගණනයේදී නිශ්චය කළ නොහැකි විය. | ලේඛකාධිකාරී ස්වාමීන් වහන්සේලා වෙත කොඩි ලබාදීම නිසා ඉතිරි කොඩි සම්බන්ධයෙන් නිවැරදි දත්ත ලබා ගැනීමට අපහසු බැවින් ඉදිරියේදී නව පාලක මණ්ඩලය දැනුවත් කර විසඳුමක් ලබා ගැනීමට අපේක්ෂා කරමි. | අදාල වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු බව |
| (ආ) | ඉකුත් වර්ෂවලදි ස්ථාවර තැන්පතු පොලි ගණනය කිරීමේදී ඇති වී තිබූ රු.83,466 ක වැරදි නිවැරදි කිරීම සමාලෝචිත වර්ෂයේ පොලී ගිණුම හරහා ගැළපීම් කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ පොලී ආදායම රු.2,091,575 ක් විය යුතු වුවත්, එය රු.2,008,019 ක් ලෙස ආදායම් හා වියදම් ගිණුමේ දක්වා තිබුණි. | පෙර වර්ෂවල ගිණුම් සැකසීමේදී ස්ථාවර තැන්පත් සඳහා ආරම්භක දින සිට වර්ෂයක් සම්පූර්ණ වන දිනය තෙක් පොලිය අදාළ කර ගත්තද අවසන් මූල්‍ය ප්‍රකාශ සඳහා මුදල් වර්ෂය ලෙස ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා පොලිය අදාළ කර ගතයුතු බැවින් පසුගිය වසරවලින් වෙනස් වූ වටිනාකම් මෙම වර්ෂයේ පොලියට ගැලපීම නිසා මෙම වෙනස පවතී. ඒ අනුව ඉදිරි කාලවල නිවැරදිව ඉදිරිපත් වනු ඇත. | පොලි ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතු බව. |
| (ඇ) | කොරෝනා වසංගතය හේතුවෙන් ආර්ථික දුෂ්කරතා ඇති විහාරස්ථානවලට 2020 වර්ෂයේදී ලබා දුන් වියළි සලාක වියදම වූ රු.98,400 ක් ප්‍රතිපුරණය සඳහා ඉකුත් වර්ෂයේදී අවශ්‍ය ප්‍රතිපාදන සලසා නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම් ගත කර තිබුණි. | 2020 වර්ෂය අවසානය වන විට වියළි සලාක ලබාදීම වෙනුවෙන් රු. 2,453,380 ක මුදලක් වැය කර තිබූ අතර නිවැරදි ආකාරයට බිල්පත් සමඟ කල ඉල්ලීම් ද නොතිබූ බැවින් මහ සභාවට ඉදිරිපත් කර මුදල් ගෙවීම නතර කරන ලදි. එහෙත් 2021 වර්ෂයේදී නැවත ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් වැය කළ නිවැරදි බිල්පත් එවා ඉල්ලුම් කිරීම නිසා මුදල් ප්‍රතිපූර්ණය සිදුකරන ලදි. | ගෙවිය යුතු වියදම් උපචිත වියදම් වශයෙන් ගිණුම් ගත කළ යුතු බව |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 135 ප්‍රකාරව අරමුදලේ මූල්‍ය පාලනය සම්බන්ධ කාර්යයන් සඳහා අධිකාර බලය පවරා දීම සිදුකර නොතිබුණි. | මුදල් රෙගුලාසි 135 ප්‍රකාරව අධිකාරි බලය පැවරීම සම්බන්ධයෙන් නව පාලක මණ්ඩලය දැනුවත් කර සකස් කර ඉදිරිපත් කිරීමට සටහන් කරගතිමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.1,192,333 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 2,651,735 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,459,402 ක වර්ධනයක් නිරීක්ෂණය විය. තැන්පතු සඳහා වූ මුළු පොලී ආදායමෙහි රු.2,052,328 ක අඩුවීමක් පෙන්නුම් කළද සමාලෝචිත වර්ෂයේදී සිසු සවිය ශිෂ්‍යත්ව ආධාර හා ගොඩනැඟිලි ආධාර ප්‍රදානයන් සිදු නොකිරීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | 2014 අංක 16 දරන සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩල (සංස්ථාගත කිරීමේ) පනතේ 6 ඡේදයේ (ඊ) උප ඡේදය පරිදි අරමුදලේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වන ප්‍රමාණවත් නිලධාරීන් හා සේවකයින් පත්කිරීම හා සේවයේ යෙදවීම සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදු කර නොතිබුණි. | නව පාලක මණ්ඩලයට මේ සම්බන්ධයෙන් කරුණු පැහැදිලි කර දැනුවත් කර ඇත. | පනතේ විධිවිධාන ප්‍රකාරව කාර්ය මණ්ඩලය පත්කර ගැනීමට කටයුතු කළ යුතු බව. |
| (ආ) | අලෙවි කිරීම සඳහා දහම් පාසල්වලට 2019 වර්ෂයේදී නිකුත් කළ කොඩි හා ස්ටිකර් වලින් ඉතිරි විය යුතු රු.6,787,371 ක් වූ තොගය දහම්පාසල් මඟින් අලෙවි කළ බවට හෝ ඉතිරිව ඇති බවට පසු විපරම් කර නොතිබුණි. | ලේඛකාධිකාරි ස්වාමීන් වහන්සේලා වරින් වර කොඩි අලෙවි මුදල් ගිණුමට බැර කිරීම සහ අදාල තොරතුරු බොහෝ දිස්ත්‍රික්කවලින් නොඑවීම හේතුවෙන් කොඩි හා ස්ටිකර් ඉතිරි තොගයේ නිශ්චිත වටිනාකම ගිණුම්වල පෙන්වීමට නොහැකි වී ඇත. | කොඩි සහ ස්ටිකර් නිකුත් කළ පසු අලෙවිය සම්බන්ධයෙන් පසු විපරම් කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | බුදුපුත් මාපිය උපහාර නිවාස ව්‍යාපෘතිය යටතේ 2020 වර්ෂයේ රාජ්‍ය වෙසක් උත්සවය පැවති කළුතර දිස්ත්‍රික්කයේ එක් ශාසනාරක්ෂක මණ්ඩලයක එක් නිවසකට රුපියල් ලක්ෂ 2 බැගින් ලබා දීමට අදාලව සම්මත වූ යෝජනාවකට අනුව කළුතර දිස්ත්‍රික්කයේ ස්වාමීන් වහන්සේලා 17 නමකට හා මහනුවර එකම පවුලක ස්වාමීන් වහන්සේ දෙනමක් සසුනට දායාද කළ දෙමාපියන්ට රු.100,000 බැගින් රුපියල් ලක්ෂ 18 ක මුදලක් පළමු අදියර වෙනුවෙන් 2021 වර්ෂයේදී ගෙවා තිබුණි. එසේ වුවද, ඊට අදාලව දෙවෙනි වාරික මුදල වශයෙන් රු.100,000 බැගින් ගෙවිය යුතු වූ රු.1,800,000 ක මුදල ගෙවීම් කිරීම සම්බන්ධයෙන් නිශ්චිත තීරණයකට එළැඹ නොතිබුණි. | නව පාලක මණ්ඩලය මේ ගැන දැනුවත් කල ද දෙවන අදියර වශයෙන් රු.100,000 බැගින් ලබාදීමට තීරණයක් ගෙන නොතිබූ නිසා මූල්‍ය ප්‍රකාශවල වගකීමක් වශයෙන් පෙන්වා නොමැත. | ගෙවීම් සම්බන්ධයෙන් පාලක මණ්ඩලය විසින් නිශ්චිත තීරණයකට එළැඹිය යුතු බව. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2014 අංක 16 දරන සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩල (සංස්ථාගත කිරීමේ) පනතේ 3 ඡේදය පරිදි සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අරමුදලේ ඉතිරිකිරීම්, ජංගම හා ස්ථාවර තැන්පතු ගිණුම්වල රු.52,769,047 ක මුදලක් පැවතියද අදාල පරමාර්ථ ඉටුකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදී වැය කළ මුදල රු.3,992,400 ක් පමණක් විය. ඒ අනුව අරමුදලේ පරමාර්ථ ඉටු කිරීම සඳහා අරමුදල කාර්යක්ෂමව යෙදවීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණු බව නිරීක්ෂණය විය. | රටේ පැවති අයහපත් සෞඛ්‍යය තත්ත්වය හේතුවෙන් අරමුදලේ පරමාර්ථ ඉටු කරගැනීමට නොහැකි වී ඇත. ඉදිරියේදී අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කිරීමට සටහන් කරගතිමි. | අරමුදලේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා අරමුදල් කාර්යක්ෂමව යෙදවීම කෙරෙහි අවධානය යොමු කළ යුතු බව. |
| (ආ) | ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සමඟ එක්ව ක්‍රියාත්මක කර තිබූ මිහිඳු නිවහන නිවාස ව්‍යාපෘතිය සඳහා 2021 දෙසැම්බර් 31 දින වන විට ලැබී තිබූ අයදුම්පත් අතුරින් සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් ගණන 1097 ක් වූ අතර ඉන් ඉදිකිරීම් ආරම්භ කර ඇති නිවාස ගණන 661 ක් විය. එසේ වුවද, ඉදිකිරීම් අවසන් කර තිබූ නිවාස සංඛ්‍යාව 189 ක් පමණක් බව ප්‍රගති වාර්තා අනුව නිරීක්ෂණය විය. | මෙම මිහිඳු නිවහන නිවාස ව්‍යාපෘතිය බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සමඟ එක්ව සිදුකරන ව්‍යාපෘතියකි. | ව්‍යාපෘති සම්බන්ධයෙන් අධීක්ෂණය හා පසුවිපරම් සිදු කළ යුතු බව. |
| (ඇ) | අරමුදලේ ප්‍රධාන කාර්යයන් අතුරින් විහාර සඳහා ගොඩනැඟිලි ආධාර ලබා දීම හා දහම් පාසල් සිසුන්ට ශිෂ්‍යත්ව ආධාර ලබා දීම 2021 වර්ෂයේදී සිදු කර නොතිබූ අතර කාර්යසාධන දර්ශක හඳුනා ගැනීම | උතුරු නැගෙනහිර විහාරස්ථාන සඳහා ගොඩනැගිලි ආධාර ඉල්ලුම් ඉදිරිපත් නොවීමත් රටේ පැවති අයහපත් සෞඛ්‍යය තත්ත්වය හේතුවෙන් දහම් | අරමුදලේ ප්‍රධාන කාර්යයන් ඉටු කිරීමට අදාලව කාර්යසාධන දර්ශක සහ තිරසර සංවර්ධන |

| | | |
|---|---|---|
| සහ තිරසර සංවර්ධන අරමුණු හඳුනා ගැනීම සම්බන්ධයෙන් අවධානය යොමු කර නොතිබුණි. | පාසල් විභාග 2020 වර්ෂයේ සිට නොපැවැත්වීමත් නිසා සිසුසවිය ශිෂ්‍යත්ව වැඩසටහන ක්‍රියාත්මක නොකළ අතර ඉදිරියේදී එම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කාර්යසාධන දර්ශක හඳුනාගැනීම සහ තිරසාර සංවර්ධන අරමුණු හඳුනා ගැනීම සඳහා නව පාලක මණ්ඩලයේ අවධානයට යොමු කිරීමට කටයුතු කරමි. | අරමුණු හඳුනා ගැනීමට කටයුතු කළ යුතු බව. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

----------------------------------------

### 4.1 අභ්‍යන්තර විගණනය

-----------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(ඊ) සහ 40 වගන්ති පරිදි සෑම අස්ථිත්වයක් සඳහාම අභ්‍යන්තර විගණනයක් සිදු කළ යුතු වුවද, අරමුදල සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 133 සහ 2018 අංක 19දරණ ජාතික විගණන පනතේ 38 (ඊ) සහ 40 වගන්ති අනුව ඉදිරියේදී අභ්‍යන්තර විගණනයක් සිදුකල යුතු බව නව පාලක මණ්ඩලය දැනුවත් කරන ලද අතර ඉදිරියේදී සාකච්ඡා කර ඒ අනුව කටයුතු කරමි. | ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |

### 4.2 අයවැය පාලනය

-------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15.1 ඡේදය මගින් ඇතුළත් කළ මුදල් රෙගුලාසි 877(1)(ඇ) වගන්තිය පරිදි අරමුදලක පාලන අධිකාරිය විසින් වාර්ෂික අයවැය ලේඛනය අරමුදලේ අරමුණට අනුකූලව පිලියෙල කර නිශ්චිත අනුමැතියන් සහිතව සැප්තැම්බර් 30 දිනට පෙර මහා භාණ්ඩාගාරයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කල යුතු වෙතත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | 1971අංක 38 දරන මුදල් පනත ප්‍රකාරව 2022 වර්ෂයට අදාලව පිළියෙල කළ වාර්ෂික අයවැය ලේඛණය ගරු අමාත්‍යතුමාගේ අනුමැතිය යටතේ ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කරන ලදි. | අදාල වර්ෂයේ අයවැය ලේඛනය පිළියෙල කර අනුමත කර ගත යුතු බව. |